

# 60 වන ශ්‍රීලංකා නිදහස් උළෙල ප්‍රංශයේ

පසුගිය සතියේ එනම් පෙබරවාරි 1 වෙනි දින සනධ්‍යාවේ පැරිස් නුවර යුනෙස්කෝ වේ අංක 1 දරණ ශාලාවට එක්වූ දහසක් ශ්‍රීලාංකික යෝද විවිධ රටවල තානාපතිවරුද ප්‍රංශ ජාතික යන් ඇතුළු විදේශිකයෝද ශ්‍රීලංකා මාතාව අධිරාජ්‍ය ග්‍රහණයෙන් මිදී 60 වසරක් ගතවීම තුටුපහටුව නැරඹුහ. එකම වහලක් යට එකම මිනිස්කමක් සහ ඒ මිනිසාට අවැසි නිදහසේ අගය මීට වසර 60 කට එහා අතීතයක් තුළින් ආවර්ජනය කළහ.

ප්‍රංශයේ ශ්‍රීලංකා තානාපති කායඊාලය ප්‍රංශ ඉතිහාසයේ ප්‍රථම වරට ශ්‍රීලාංකිකයන්ට සහ භාගිවිය හැකි උළෙලක් එසේම නොමිළයේම නැරඹිය හැකි දේශීය ගායනා හා වාදන රැගත් අපේම ප්‍රසංගයක් පැවැත්වීම වෙනත් වර්ෂයන්හි පවත්වන අයුරින් තානාපතිවරුන්ට සහ ඉහළ පෙලැන්තියේ අයට විස්කි වයින් ප්‍රදානය කර මින් ශ්‍රීලංකාවේ නිදහස ගැන උදම් අනනවාට වඩා කොතරම් අගේදැයි මෙදා උත්සවයට සහභාගි වූ සැම කෙනෙකුම සිතුවා නිසැකය.

ප්‍රංශයේ ශ්‍රීලංකා තානාපති කායඊාලය ප්‍රංශ ඉතිහාසයේ ප්‍රථම වරට ශ්‍රීලාංකිකයන්ට සහභාගිවිය හැකි උළෙලක් එසේම නොමිළයේමනැරඹිය හැකි දේශීය ගායනා හා වාදන රැගත් අපේම ප්‍රසංගයක් පැවැත්වීම වෙනත් වර්ෂයන්හි පවත්වන අයුරින් තානාපතිවරුන්ට සහ ඉහළ පෙලැන්තියේ අයට විස්කි වයින් ප්‍රදානය කරමින් ශ්‍රීලංකාවේ නිදහස ගැන උදම් අනනවාට වඩා කොතරම් අගේදැයි මෙදා උත්සවයට සහභාගි වූ සැම කෙනෙකුම නොසිතුවා නම් පුදුමයකි.

සිංහල දෙමළ බසින් නිර්මාණය කළ ගීතයක් ශිල්පීන් දෙදෙනාම ගායනා කිරීම මෙහි තවත් විශේෂයකි. පැරිස් නුවර සරසවි රංග කලායතනය අපේ දරුවන්ගේ රංග කුසලතා එළිදැක්වූ අතර පැරිසියේ ශ්‍රී වාද්‍ය වෘන්දය මියුරු සංගීතය සැපයුවාය.

ප්‍රංශයේ ජීවත්වන අපේ දරුවන් අප රට පැගී සිටි බවත්, එම ග්‍රහණයෙන් මිදී නිදහස ලැබුණු බවත් කිසිවක් නොදන්නා අවධියක මෙවැනි අවස්ථාවක් සලසා දීම ප්‍රංශයේ වැසි ශ්‍රීලාංකකයන් හා ශ්‍රීලංකා තානාපති කායඊාලය අතර ඇති විය යුතු හොඳ සම්බන්ධතාවක ප්‍රවිෂ්ටයක් ලෙස සටහන් විය යුතුය. ගරු චිත්‍රාගනී වාගීෂ්වර ශ්‍රීලංකා තානාපති තුමිය මෙම කර්තව්‍යයෙහි පෙර ගමන්කාරිය වී ඇත.

♦ අමර ගුණසේකර Paris France

## මෙන්න අළුත්ම කොටි මායම

# බත් පාර්සලයක් බඩේ බැඳන් ඇවිත්

ගිය සතියේ එනම් පෙබරවාරි 7 වෙනි දින උදේ ඉන්දියානු විදියේ සල්වාර් ඇඳුමක් ඇඳ සිටි තරුණ ගැහැණු කෙනෙක් මහනුවරින් තෙල්දෙනිය බසයකට නැග්ගාය. ඇය දිගන දී බසින විට පොලීසිය එතැනය. පොලිස් කාන්තාවක් ඇය පරීක්ෂාකළාය. ගැහැණිය එම සල්වාර් කමීසයට යටින් බඩේ කිසියම් පාර්සලයක් බැඳගෙන සිටියාය. ඒ කුමක් දැයි පොලිස් කත ඇසූවිට ගැහැණිය උත්තර දුන්නේ ඒ බත් පාර්සලයක් කියාය. ඒ විදියට බත් මුලක් ගෙන යන්නේ ඇයි දැයි ඇසූවිට ඒ විදියට හරි පහසුයයි ගැහැණිය ගණනකට ගෙන උත්තර දුන්නා පමණක් නොව ඇයි එහෙම ගෙනියන්න බැරිද කියාත් ඇසුවාය. පොලීසිය ඇය අත් අඩංගුවට ගත්තේ ය.

ඇය උතුරේ සිට පැමිණ ඇති බවත්, සිංහල හරිහැටි කතා කරන්නට බැරි බවත් වැටහිණ. පොලීසිය කියන්නේ ඇය ඊළඟ දවසේ බෝම්බයක් ගෙන යන අදහසින් පෙර හුරුවක් සඳහා බත්මුලක් බඩේ බැඳන් ආ බවයි. එසේම ආරක්ෂක අංශ මුරපොළ වලදී ගැහැණියක් හමුවූ විට කෙසේ පරීක්ෂා කරන්නේදැයි දැන ගැන්මටද විය හැක. මෙය කොටි මායමක් බව පොලීසිය කියයි. වැඩිදුර පිරික්සුමට ගැහැණිය තවමත් අත්අඩංගුවේ පසුවේ.

# ශ්‍රීපති රිය අනතුරින් මියයයි



අවාසනාවන්ත මරණයකට ගොදුරු වූ ශ්‍රීපති සූරියාරච්චි මහතා



ගහේ හැපී විනාශවුනු රථය

පසුගිය සෙනසුරාදා අනුරාධපුරයේ ගල්ගමුව මැදගම ප්‍රදේශයේදී සිදුවූ මාරක රිය අනතුරකින් හිටපු ඇමති වරයෙකු වූ ගම්පහ දිස්ත්‍රික් පාර්ලි මේන්තු මන්ත්‍රී ශ්‍රීපති සූරියාරච්චි මහතා ඇතු සිව් දෙනෙක් මිය ගියහ. පැයට සැතපුම් 120 කටත් වඩා වේගයෙන් පැදවූ ජීප් රථය පාරෙන් ඉවතට ලිස්සා ගොස් දැවැන්ත ගසක හැපීමෙන් මේ විපත සිදුවී ඇත.

මන්ත්‍රීවරයාගේ රියැදුරා ද ආරක්ෂක නිලධාරියා ද මිතුරෙකු ද මිය ගිය අනෙක් අයයි. රියේ සිටි තවත් දෙදෙනෙකු බරපතල තුවාල ලබා රෝහලේය. කලින්දා අනුරාධපුරයට ගිය ඔවුන් ආපසු ආවේ කුරුණෑගල රැස්වීමකට යාම පිණිසය. වේගයෙන් රිය පදවන්නට ඇත්තේ වෙලාවට රැස්වීමට ළඟාවන්නට යයි අනුමාන කෙරේ.

# A fat minister is an unhealthy sight



Minister Nimal Siripala with Director General of WHO Dr Margaret Chan

Some one should question the health and shape of our health minister. It is rather shameful to look at the Hon Minister and his shape and still be the rep for Sri Lanka's health issues. There is nothing that Lanka Mission in Geneva can do, only the minister himself can do something to shape up. A fat minister is an unhealthy site and then to represent the health of all Lankans.

I too work in the health & nutrition field and there are million things that one can do look healthy, and shape up, especially with the amount of tax-free money he earns. He represents a nation in crisis, at war, high in malnutrition, low food security, low birth weight, all kinds of pollution, rising cost of living yet a beautiful proud nation struggling to stay united.

Meanwhile, I am an active Sri Lankan to bring peace and a good image to our Lanka, and that is why I make this statement, and I am sorry to say that it is truly a shameful site.

♦ Lalith Jayawickrame -Iowa,USA

## සෞඛ්‍යට අහිතකර මහා ස්ථූල ශරීර

මේ වම් පස පින්තූරයේ සිටින්නේ ශ්‍රීලංකාව නියෝජනය කරමින් ජිනීවාහි ලෝක සෞඛ්‍ය සංවිධානය අමතන්නට ගිය අපේ රටේ සෞඛ්‍ය ඇමති නිමල් සිරිපාල ද සිල්වා මහතා ය.

සෞඛ්‍ය ඇමතිවරයාගේ ඉතා මහත ශරීරය දෙස බැලූ ඕනෑම කෙනෙකුට ක්ෂණිකව හැඟී යනවා ඇත්තේ සැමට පළමු සෞඛ්‍ය ඇමතිවරයාම ශරීර සෞඛ්‍ය ගැන පාඩම ඉගන ගත්තොත් වඩා හොඳ බවය. ඉංග්‍රීසි කියමනක් ඇත. එය මෙසේය. Physician heal thyself. එහි අරුත " වෙදැදුරාණනි! ඔබම මුලින් සුවපත්ව ඉන්න!"

♦ ලලිත් ජයවික්‍රම Iowa USA



# ෆෙඩරල් ? මොන ෆෙඩරල්ද? ඇමරිකාවෙ Federal ද? චෙල්වනායගම්ගෙ Federal ද?



ප්‍රභාකරන්

=



චෙල්වනායගම්

මේ ලියවිල්ල පටන් ගන්න ඕන මෙන්න මෙතනින්. සිංහලයින්ගෙ මහා දුර්වල කල්පනා ශක්තිය සහ යමක් ක්ෂණිකව තේරුම් ගන්න හැකියාවක් නැතිකම ගැන. හුගාක් දේවල් සිංහලයින්ට තේරෙන්නෙ බොහොම කාලයක් ගියාට පස්සෙ. එතකොට වෙන්න තියන දේ වෙලා ඉවරයි.

ඉතින් යුද්දෙ තව ඉවර වුනෙත් නැහැ. ඒ සේරම තියෙද්දි ලොකු හදිසියකින් කලබලවෙලා, මෙන්න ඕල් පාටි කියල එකක් හදාගත්තා. දැන් කරන්න ඕනදේ ඒ ගොල්ල කියනවා. 13 වෙනි සංශෝධනේ ආයි ඕනලු, උතුරු නැගණහිර එකතු කරන්න ඕනලු, ගළවන්න ඕනලු, රටේ අගනුවර කොළඹින් අනුරාධ පුරේට ගෙනියන්න ඕනලු ඔයවගේ වැඩ සීයයි. මිනිස්සු කියන්නෙ ඔක්කෝටම ඉස්සෙල්ලා යුද්දෙ ඉවරකරලා හිටපල්ලා. ඊට පස්සෙ අනික් දේවල් ගැන හිතපල්ලා.

මේ හදිස්සිය මොකද? මේ පිටරටවල් කියන නිසා. ජපන්කාරයා අකාෂි, ක්ලින්ටන් ගෑනි, කීත් වාස්, සයිමන් හියුස්, රාධිකා කුමාරස්වාමි, ජෙහාන් පෙරේරා, මන්නාරමෙ බිෂොප්, කරුණා නිධි, මරදානෙ චොප්පෙ අයියා, සොත්ති උපාලි, ඔය කට්ටිය කියන හන්ද යුද්දෙත් තවම එහෙම තියෙද්දි මේ දනිපනි ගාලා ලැස්ති වෙන්නෙ. ලංකා ආණ්ඩු කවදත් වැඩකරන්නෙ එක එකාට ඕන විදියට. නැතුව තමන්ට ඕන විදියට නෙවෙයි.

සුනාමි අනාථයන්ට ගෙවල් හදල දෙන්න, බඩු මිළ බස්සන්න, රටේ අපරාධ නවත්වන්න, රජයට ඔය හදිස්සි නැත්තෙ ඇයි? ඒවට නේ හදිස්සි වෙන්න ඕන.

ඊළඟට දැන් හැම පැත්තෙන්ම පෙඩරල් කතාවක් ඇහෙනවා. " ලංකාවෙ වාර්ගික අර්බුදයට පෙඩරල් විසඳුමක් අවශ්‍යයි." බොහොම ගාම්භීර විදියට කියනවා. Federal කියන වචනෙ ඉංග්‍රීසි තේරුම නම් **කොටස් කීපයකින් යුත් නිදහස් පාලන තන්ත්‍රය කියන** එක. ඔය වචනෙ ඉස්සෙල්ලම ලංකාවෙ කටට හුරුවුණේ හතළිස් ගණන්වල අග චෙල්වනායගම් පෙඩරල් පක්ෂය කියලා දේශපාලන පක්ෂයක් හදාගත්තමයි. ලංකාවෙ ගම්වල මිනිස්සු කිව්වෙ **පරඩැල් පක්සෙ** කියලයි.

ඇමරිකාව පෙඩරල් ක්‍රමයට පාලනය වෙන්නෙ. ඇමරිකාව මහා සද්දන්ත රටක් නිසා මහ ආණ්ඩුවට ලේසි වෙන්න මුළු ඇමරිකාව වෙනම කුඩා ප්‍රදේශ වලට කඩලා, ඒවට වෙනම ආණ්ඩුකාරවරු පත්කරලා, වෙනම ප්‍රාදේශීය සභාවලින් පාලනය වෙනවා. ඒ සේරම සභා මෙහෙය වන්නෙ වොෂිංටනයෙ ධවල මන්දිරයෙ ඉන්න ඇමරිකානු ජනාධිපති කායඊාලයෙන්.

හැබැයි ලංකාව වගේ අල්ලක් විතර පුංචි රටක් එහෙම කෑලිවලට කැඩුවොත් විනාස වෙලා යනවා. කුඩා රටවල් වලට පෙඩරල් ක්‍රමය අල්ලන්නෙ නැහැ. ඒක ලෝකෙම පිළිගැන්ම.

චෙල්වනායගම්ගෙ පෙඩරල් පක්ෂය ඉංග්‍රීසියෙන් පෙඩරල් වුනාට ඒකෙ දෙමළ නම **තමිල් අරසු කච්චි**. ඒ කියන්නෙ **දෙමළ රාජ්‍ය පක්ෂය**. ඒක ඇමරිකන් පෙඩරල් ක්‍රමයට හාත්පසින්ම විරුද්ධ, මහා ජාතිවාදී ක්‍රමයක්. චෙල්වා ඒ පක්ෂය පිහිටුවා ගත්තෙ දැන් ප්‍රභාකරන් කරන්න යන දේ ඒ කාලෙ කරන්නයි. එනම්, ද්‍රවිඩ රාජ්‍යයක් ගොඩ නගන්නයි. චෙල්වා කවදාවත් තමන්ගෙ යටි අදහස පෙන්නුවෙ නෑ. චෙල්වා විතරක් නෙවෙයි කිසිම දෙමළ දේශපාලනඥයෙක් යටි අදහස තවමත් කියන්නෙ, පෙන්නන්නෙ නෑ. ඒ කාගෙත් යටි අදහස තමයි කවද හරි ලංකාවෙ තනිකරම දෙමළ රාජ්‍යයක් ගොඩ නගන එක.

චෙල්වා ලෝකෙට පෙන්නුව ඉංග්‍රීසි **Federal** වචනෙ නිසා බටහිර හිතුවෙ අනේ මේ ඇමරිකාවෙ වගේ පෙඩරල් ක්‍රමයක් කියලා. අපේ ගොන් වාහෙලා චෙල්වනායගම්ගෙ ක්‍රමය ලෝකෙට තේරුම් කරලා දුන්නෙ නැහැ. දෙමළ අයත් කොළේ වහලා කතා කරන්නෙ. සිංහල මිනිස්සු දැන්වත් දැන ගන්න ඕන, මේ යන්න හදන්නෙ ආයිත් ඊළම දිහාවට කියලා. දැන් කාලෙකට පස්සෙ ආයිත් මෙන්න පෙඩරල් ක්‍රමයක් ගැන ලංකාවෙ කතා වෙනවා. එහෙම ක්‍රමයක් හොඳලු. මෙතනදි අහන්න තියෙන්නෙ එක ප්‍රශ්නයයි. පෙඩරල් කියන්නෙ මොන පෙඩරල්ද? ඇමරිකන් පෙඩරල්ද? චෙල්වගෙ පෙඩරල්ද? මොන වෙසෙන් ආවත් පෙඩරල් දුන්නොත් ඒ තමයි දෙමළ ඊළම ආරම්භය. කතාකරන්න දෙයක් නෑ. එතනින් ලංකාව ඉවරයි.

මට දිවංගත විකටශිල්පි සැමුවෙල් රුද්‍රිගුගෙ **අමාරිස් අයියා** වැඩසටහන මතක් වෙනවා. අමාරිස් අයියගෙන් සාමාන්‍ය දැනීමෙ ප්‍රශ්නයක් කෙනෙක් අහනවා. " ආප්පයක් දාන්න කොච්චර වෙලා යනවද? " ඒකට අමාරිස් අයියා දෙන උත්තරේ මේකයි. " ආප්ප කිව්වම මොන ආප්පද? බිත්තර ආප්පද? පැණි ආප්පද? " පෙඩරල් ගැනත් එච්චරයි. මොන පෙඩරල්ද?

♦ වෙලේගෙදර රාළ London